ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## පුවත්පත් නිවේදනය

<u>ඉන්දියානු නාවික හමුදාවේ බට්ටි මල්ව් නෞකාව ත්‍රිකුණාමලයේ සංචාරයක නිරත වේ</u>

ඉන්දියානු නාවික හමුදාවේ බට්ටි මල්ව් නෞකාව 2023 මැයි 16-17 දිනවල ත්‍රිකුණාමලයේ මෙහෙයුම් සංචාරයක නිරත විය. දිවයිනට පැමිණි මෙම නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නාවික සම්ප්‍රදායන්ට අනුව උණුසුම් අයුරින් පිළිගන්නා ලදී.

2. ඉන්දියානු නාවික හමුදා නෞකාවේ අණදෙන නිලධාරි ලුතිනන් කමාන්ඩර් මන් සිං එම්. මහතා නැගෙනහිර නාවික විධාන මූලස්ථානයේ දී නැගෙනහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් අද්මිරාල් එච්. ජී. යූ. ඩී. කුමාර මහතා හමු විය. 2023 ජූනි 21 වන දින පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර යෝගා දිනය දක්වා වන දින 50 තුළ සංවිධානය කෙරෙන වැඩසටහනක් වශයෙන් පවත්වන ලද යෝගා සැසියක් ඇතුළු විවිධ පුහුණු නියැළීම් නෞකාවේ සංචාරය අතරතුර දී සිදු කරන ලදී.

3. දකුණු පළාතේ දරුවන් පිරිසක් හමුවූ නෞකා කාර්ය මණ්ඩලය ඔවුන්ට අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ඉවහල් වන සහයෝගයන් ද ලබා දුන්හ. 2023 මැයි 17 වන දින නෞකාව ශ්‍රී ලංකාවෙන් පිටත් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ රණධීර නෞකාව සමඟ PASSEX නාවික අභ්‍යාසය සඳහා ද සහභාගී විය.

4. වේගවත් මුර සංචාර නෞකාවක් වන ඉන්දිය නාවික හමුදාවේ බට්ටි මල්ව් නෞකාවේ සංචාරය කලාපයේ පොදු සමුද්‍රීය අභියෝගයන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ එවන් වේගවත් මුර සංචාර යාත්‍රා හි හැකියාවන් ඉහළ නැංවීම වෙනුවෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවය ඉහළ නැංවීමට තිබෙන විභවතාවය සම්බන්ධයෙන් ද වැදගත්කමක් උසුළයි.

5. තව ද ඉන්දිය නාවික හමුදාවේ කිල්තාන් සහ සාවිත්‍රි නෞකාවන් SLINEX – 23 සඳහා සහභාගී වීම වෙනුවෙන් 2023 අප්‍රේල් 03-06 දිනවල කොළඹ සංචාරයක නිරත විය. ඉන්දිය නාවික හමුදා නෞකාවන්ගේ ශ්‍රී ලංකා සංචාර ඉන්දියාවේ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය අනුව අසල්වැසි රාජ්‍යයන් දෙකෙහි නාවික හමුදාවන් අතර සමීප මිත්‍රශීලීත්වය සහ කාර්ය සහයෝගීතාවය ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

***

කොළඹ
2023 මැයි 17